**කැලණිය ප්‍රාදේශීය සභාව - 2021**

**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**-----------------**

### 1.1. තත්ත්වාගණනය කළ මතය

**--------------------------------**

කැලණිය ප්‍රාදේශීය සභාවේ 2021දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කැලණිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.**

### 1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

-----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද පහත සඳහන් නිර්දේශයන් ක්‍රියාත්මක කර නොතිබුණි.

| යොමු අංකය | නිරීක්ෂණය | නිර්දේශය |
|---|---|---|
| 1.6.2 (අ) | අංක 2155/8 හා 2019 දෙසැම්බර් 24 දිනැති අති විශේෂ ගැසට්පත්‍රය මඟින් පනවා ඇති බස්නාහිර පළාත් ප්‍රාදේශීය සභා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ රීති අංක 83 (ii) අනුව සේවක ණය සඳහා අත්තිකාරම් ගිණුමක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | අත්තිකාරම් ගිණුමක් පවත්වාගෙන යෑමට කටයුතු කළයුතු වේ. |
| 1.6.2 (ඉ) | 2020 වර්ෂයේ ගොඩනැගිලි රු.189,000 ක්, යන්ත්‍ර රු.305,389 ක් පරිගණක රු.973,096 ක් කාර්යාල උපකරණ රු.674,351 ක්, ලීබඩු රු.52,625 ක්, මාර්ග හා පාලම් රු.38,775 ක් ලෙස එකතුව රු.2,233,236 ක් ස්ථාවර වත්කම් වලින් බැහැර කර තිබූ නමුත් ඒ සඳහා ක්ෂය ලෙස බැහැර විය යුතු රු.254,200 ක් ගලපා නොතිබීම හේතුවෙන් එම වටිනාකමින් අතිරික්තය අඩුවෙන් දක්වා තිබුණි. තවද, ක්ෂය වටිනාකම ඉවත්කිරීමේ ගිණුමට හා ක්ෂය වෙන් කිරීමේ ගිණුමට ගලපා නොතිබුණි. | ඉවත්කරන වත්කම්වලට අදාල ක්ෂය වෙන්කිරීමද නිසි පරිදි ගැලපීමට කටයුතු කළයුතු වේ. |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1. ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2020 වර්ෂයේදී ලද රු.30,092,938 ක් වූ ප්‍රාග්ධන ප්‍රදානය යොදවා ඉදිකල මංමාවත්, බෝක්කු හා පාලම් සඳහා වන ක්ෂය අනුපාතය වන සියයට 10 යටතේ එම ප්‍රාග්ධන ප්‍රදානය සඳහා 2021 වර්ෂයේදී ක්ෂය කළ යුතු වටිනාකම රු.3,009,294 කි. නමුත්, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ අයභාරය යටතේ පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයෙන් කළ මාරු කිරීම් ලෙස දක්වා තිබුණේ රු.1,979,610 ක් පමණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ රු.1,029,684 ක් බැගින් අතිරික්තය අඩුවෙන් ද ප්‍රාග්ධන ප්‍රදාන වැඩියෙන්ද ගිණුම්ගත කර තිබුණි. | | |
| (ආ) 2020 වර්ෂයේදී ලද ප්‍රාග්ධන ප්‍රදානය වන රු.30,092,938 සඳහා එම වර්ෂයේදී ක්ෂය නොකළ යුතු වුවත් රු.5,817662 ක් ක්ෂය වශයෙන් ගිණුම්ගතකර තිබුණු නමුත් එම වරද සමාලෝචිත වර්ෂයේදී නිවැරදිකර නොතිබීම හේතුවෙන් රු.5,817,662 කින් සමුච්චිත අරමුදල් ශේෂය වැඩියෙන්ද ප්‍රාග්ධන ප්‍රදාන ශේෂය අඩුවෙන්ද ගිණුම්ගත කර තිබුණි. | 2022 අවසාන ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 3.5 අනුව වත්කම් මිලදීගත් වර්ෂයට ක්ෂය කරනු නොලබන බව දක්වා ඇතත්, 2020 වර්ෂයේ මිලදීගත් ලෝඩර් යන්ත්‍රයේ හා රියදුරු අසුන සහිත තණකොළ කපන යන්ත්‍රයේ වටිනාකම වූ රු.6,181,000 ක් සඳහා එම මිලදීගත් වර්ෂයට රු.309,050 ක් ලෙස සමාලෝචිත වර්ෂයේ ක්ෂය කර සමුච්චිත අරමුදලට ගලපා තිබීම හේතුවෙන් සමුච්චිත අරමුදල අඩුවෙන්ද යන්ත්‍ර ක්ෂය වෙන් කිරීමේ ගිණුම වැඩියෙන්ද දක්වා තිබුණි. | | |

(ඈ) පෙර වර්ෂයේ වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේදී රු.392,500 ක් වටිනා සවිකිරීම් කාර්යාල උපකරණ ලෙස හඳුනාගෙන තිබීම නිවැරදි කිරීම සඳහා උපකරණ ගිණුමෙන් ඉවත් කර සවිකිරීම් ගිණුමට හර විය යුතු වුවත් සමුච්චිත අරමුදලට හර කර තිබුණි.

(ඉ) රියදුරු අසුන සහිත තණකොළ කපන යන්ත්‍රය මිලදී ගැනීමට 2020 වර්ෂයේදී රු.1,216,000 ක් ණය හිමියන් ලෙස වෙන් කර තිබුණද, එම යන්ත්‍රයේ සත්‍ය වටිනාකම රු.994,500 ක් වී තිබුණි. මෙය සටහන් කිරීමේදී සමුච්චිත අරමුදල හර කර යන්ත්‍ර ගිණුම බැර කර තිබීම හේතුවෙන්, රු.221,500 කින් ණය හිමි ශේෂය වැඩියෙන්ද, සමුච්චිත අරමුදල් ශේෂය අඩුවෙන්ද ගිණුම්ගතකර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසාන දින වනවිට මිලදී ගැනීම් කටයුතු අවසාන නොකරන ලද, ණය හිමියන් ලෙස උපලේඛනයේ දක්වා ඇති රු.7,000,000 ක් වටිනාකම විදුලි ජනක යන්ත්‍ර මිලටගැනීම්, යන්ත්‍ර කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කළ යුතු වුවත් වියදම් ගිණුමකට ගිණුම්ගත කර තිබුණි.

(උ) ආදායම් වර්ග 7 ක 2020 ජනවාරි 01 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව සහ උපලේඛන අනුව ශේෂයන්හි පැවති වැඩිවීම් හා අඩුවීම් වටිනාකම් 2020 වර්ෂයේදී එක් එක් හිග හිටි ආදායම් ගිණුම්වලට ගලපනු වෙනුවට වෙනස වූ රු.480,602 ක් සංචිත හා වෙන් කිරීම් ගිණුමට ගලපා තිබුණි.

(ඌ) රු.213,600 කින් පරිගණක යන්ත්‍ර ප්‍රත්‍යාගණනය කිරීමේදී පරිගණක ගිණුම හර කර සංචිත හා වෙන් කිරීමේ ගිණුම බැර කළයුතු වුවත් පරිගණක ගිණුම හර කර සමුච්චිත අරමුදල බැර කර තිබුණි.

2022 අවසාන ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරමි.

නිවැරදිව ගිණුම්ගත කළයුතුය.

1.6.2. **නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 11 කට අදාලව 2021 දෙසැම්බර් 31 දිනට, මූල්‍ය ප්‍රකාශන අනුව එකතු වටිනාකම රු.2,428,249,496 ක් හා උපයෝගී ලේඛනවල එකතු වටිනාකම රු.2,060,001,047 ක් වූයෙන් රු.368,248,449 ක වෙනසක් නිරීක්ෂණය විය. | මූල්‍ය ප්‍රකාශන නිවැරදි කරමින් පවතී. | වෙනස් කම් හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

1.6.3. **විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වටිනාකම රු.37,299,020 ක් වූ ගිණුම් විෂයයන් 03 ක් සඳහා ලේඛන/උප ලේඛන ඉදිරිපත් නොකිරීම නිසා ඒවා සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | ඉදිරියේදී උපලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | උපලේඛන සකස්කර ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

2.1. **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.25,202,130 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.197,322,161 ක් විය.

2.2. **ආදායම් පරිපාලනය**

------------------------

**ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

-----------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් ශේෂය පරිසනක මෘදුකාංගයට අනුව රු.41,977,493 ක්, හිඟ ආදායම් වාර්තාවට රු.42,319,900 ක් සහ කාල විශ්ලේෂණ වාර්තාව අනුව රු.45,454,000 ක් වී තිබුණි. කාල විශ්ලේෂණය අනුව හිඟ වරිපනම් ශේෂය රු.45,454,000 ක් තුළ වසරකට අඩු, වසර 1 ත් 2 ත් අතර වසර 2 ත් 3 ත් අතර, වසර 3 ත් 5 ත් අතර, වසර 5 ත් 10 ත් අතර හා වසර 10 ට වැඩි ශේෂ පිළිවෙලින් රු.6,413,398 ක්, රු.5,139,994 ක්, රු.1,379,566 ක්, රු.10,978,705 ක්, රු.9,753,711 ක් හා රු.11,788,626 ක් වූ අතර එම ශේෂයන් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | පරිසනක මෘදුකාංගයේ ශේෂය හා කාල විශ්ලේෂණ ශේෂය අතර වෙනස රු.3,476,507 ක් සම්බන්ධයෙන් මෘදුකාංගයට අදාල ආයතනය සමග සාකච්ඡා කර නිවැරදි කර ගැනිමට කටයුතු කරමි. | දත්ත අතර පවතින වෙනස්කම් හඳුනා ගෙන නිවැරදි හිඟ වරිපනම් ශේෂ අයකර ගැනීමට කටයුතු කල යුතුය |
| (ආ) | 2021 ඔක්තෝබර් 30 දින වන විට සභා බල ප්‍රදේශයේ පැවති සම්ප්‍රේෂණ කුළුණු 25 කින් රු.75,000 ක හිඟ සම්ප්‍රේෂණ කුළුණු ආදායමක් අයකර ගැනීමට පැවතුණි. | ලැබිය යුතු රු.75,000 අයකර ගැනිම සඳහා 2021 ඔක්තෝබර් 12 සහ 2022 පෙබරවාරි 21 දින ලිපි මගින් දැනුම් දී දුරකථනයෙන් විමසිම් කල විට ඉදිරි සති දෙකක් තුල ගෙවා අවසන් කරන බව දැනුම් දෙන ලදි. | හිඟ සම්ප්‍රේෂණ කුළුණු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

3. **මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1. කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තොරණ හන්දියේ පොදු වෙළඳපල කඩ කාමර 29 න් 15 කට අදාළ වලංගු ගිවිසුම් නොතිබුණ අතර, 11 ක් සඳහා පැවති ගිවිසුම් 1998 වර්ෂයේ සිට 2005 අතර කාලයේදී අවසන්වී තිබුණද නව ගිවිසුම් ඇති කර ගෙන නොතිබුණි. තවද 2020 ඔක්තෝබර් මස තක්සේරු දෙපාර්තමේන්තුව විසින් මෙම කඩ කාමර සඳහා නව තක්සේරුවක් සිදුකර තිබුණද කඩ හිමියන්ගේ විරෝධතා ඉදිරිපත්වීම හේතුවෙන් එය ක්‍රියාත්මක කිරීමට නොහැකිව තිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලද නව තක්සේරු මාසික කුලිය අනුව 2021 මාර්තු 01 දින සිට ගිවිසුම් ගත වීමට පැමිණෙන ලෙස කඩ හිමියන් වෙත දැනුම්දෙන ලදී. එහිදී ඔවුන්ගේ විරෝධතා සලකා බැලීම සඳහා විරෝධතා පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කරන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් 2022 පෙබරවාරි 25 දින ඉල්ලීම් කර ඇත. | වලංගු ගිවිසුමක් සහිතව කඩ කාමර බදු දීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කිරිබත්ගොඩ පොදු වෙළඳපල කඩ කාමර 151 න් 15 කට වලංගු ගිවිසුම් නොතිබුණ අතර, කඩ කාමර 67 ක ගිවිසුම් කාලය වර්ෂ 1980 සිට 1990 දක්වා කාලය අතරද , කඩ කාමර 40 ක වර්ෂ 1991 සිට 2000 දක්වා කාලය අතරද, කඩ කාමර 3 ක වර්ෂ 2001 සිට 2010 දක්වා කාලය අතරද කල් ඉකුත්වී තිබුණි. එම කඩ කාමර දිගුකාලීන බදු පදනම මත ලබා දී තිබීම නිසා මුල් බදුකරුවන් නොමැතිවීම හා අතුරු බදු තිබීම හේතුවෙන් නව ගිවිසුම් ඇති කර ගැනීමට නොහැකිව තිබුණි. | මෙම කඩ කාමර දිගු කාලීන බදු ලබා දෙන ලද කඩ කාමර වන අතර එම කඩ කාමරයන්හි මුල් බදු කරුවන් නොමැත. අතුරු බදු පැවරීමට ලබාදෙන ලද කාලය සංශෝධනය කර ගැනීමට සහකාර කොමසාරිස් වෙතින් නිර්දේශ කර පළාත් පාලන කොමසාරිස් වෙත ඉදිරිපත් කර ඇත. 2020 දෙසැම්බර් 03 දිනැතිව නිකුත්කරන ලද දෙපාරතමේන්තු චක්‍රලේඛ අංක LGD/13/2016 අනුව අතුරුබදු පැවරීම සම්බන්ධයෙන් සභාව විසින් තීරණය කළ යුතු බව සඳහන් කර ඇති බැවින් ඉදිරියේදී ඒ අනුව කටයුතු කරමි. | වලංගු ගිවිසුම් සහිතව කඩ කාමර බදු දීමට කටයුතු කළ යුතුය |
| (ඇ) | තක්සේරු දෙපාර්තමේන්තුව විසින් කිරිබත්ගොඩ නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර සඳහා 2018 ඔක්තෝබර් මසද, හුණුපිටිය නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර සඳහා 2018 ජුනි මසද නව තක්සේරුවක් සිදුකර තිබුණි. නමුත් කඩ කාමර 20 ක ගිවිසුම් අවසන් වී තිබුණද, නව ගිවිසුම් ඇති කර ගෙන නොතිබුණි. | නව මාසික තක්සේරුව ලබා දෙන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇත. | වලංගු ගිවිසුම් සහිතව කඩ කාමර බදු දීමට කටයුතු කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 24(1)(ආ) වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශයට අයත් මංමාවත් සම්බන්ධව සමීක්ෂණය කර සභා අයිතියට පවරාගෙන ගිණුම්ගත කිරීමට සහ ලේඛණගත කිරීමට කටයුතු කර නොතිබුණි. | හදුනාගත් මාර්ග 09 ක් මිනුම් ගත කිරීම සඳහා මානක තැන වෙත භාරදී ඇති අතර, එම සැලසුම් ලබාගෙන අයිතිය පවරා ගැනීමට කටයුතු කරමි. | පනත අනුව කටයුතු කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය සඳහා රු.මිලියන 50 ක වියදමක් සන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන සඳහා දරා තිබූ අතර පරිසර බලපත්‍රයක් ලබානොගෙන කොම්පෝස්ට් අංගනයක්ද ඇතුළුව කසළ අංගනයක් පවත්වාගෙන ගොස් තිබුණි. කොම්පෝස්ට් නිෂ්පාදනයේ අතුරු ඵලයක් වන leachate ප්‍රතිකර්ම පද්ධතියෙහි ඉදිකිරීම් කටයුතු අවසාන නොකිරීම හේතුවෙන් පරිසර බලපත්‍රය ලබා ගැනීම සඳහා කරන ලද ඉල්ලීම මධ්‍යම පරිසර අධිකාරිය විසින් ප්‍රතික්ෂේප කර ඇත. | මෙම වසර තුළදී පරිසර බලපත්‍රය ලබාගැනීමට හැකි බව මධ්‍යම පරිසර අධිකාරිය විසින් දන්වා ඇත. | පරිසර බලපත්‍රය ලබා ගෙන කොම්පෝස්ට් අංගනය හා කසල අංගනය පවත්වාගෙන යැමට කටයුතු කළ යුතුය . |

3.2. **නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ පවතින 2010 වර්ෂයේදී සභා අරමුදලින් මිලදීගත් රු.12,654,144 ක් වටිනා PC ස්කැවේටරය, 2015 වර්ෂයේදී පලාත් සභා හා පලාත් පාලන අමාත්‍යාංශයෙන් ප්‍රදාන ලෙස ලද ටොන් 8 ගල් රෝල සහ 2016 වර්ෂයේදී පලාත් පාලන අමාත්‍යාංශයෙන් ප්‍රදාන ලෙස ලද බාච් යන්ත්‍රය වර්ෂ 04 සිට වර්ෂ 07 දක්වා කාලය තුළ භාවිතයෙන් ඉවත්කර තිබුණ අතර ඒවා අලුත්වැඩියා කිරීමට, විකිණීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි . | අදාල යන්ත්‍ර 03 මිල්ලෙනිය ප්‍රාදේශීය සභාවේ සභාපති විසින් පරීක්ෂා කර භුවමාරු කර ගැනීමට සුදුසු ද යන්න නිරීක්ෂණය කරන ලදී. PC 50 ස්කැවේටර් යන්ත්‍රය 2018 පැවති අපහරණ කටයුතු සඳහා ඉදිරිපත් කර ඇතත් වැඩිම ලංසුව ඉදිරිපත් කරන ලද තැනැත්තා විසින් මුදල් ගෙවා එය නිදහස් කරගෙන නොමැත. | අලුත් වැඩියාකර භාවිතයට ගැනීමට හෝ විධිමත් පරිදි අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.3. වත්කම් කළමනාකරණය

-----------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ ) | **වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම** | | |
| | සභාව සතු ඉඩම් අතරින් ඉඩම්, සුසාන භූමි සහ නාන ළිං 13 ක භූමියේ විශාලත්වය සොයාගත නොහැකි වී තිබුණි. | ඉඩම් මිනුම් කිරීමට කටයුතු ආරම්භ කර ඇත. | හඳුනා නොගත් ඉඩම් හඳුනා ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ආ ) | **අයිතිය තහවුරු නොවූ වත්කම්** | | |
| | සභාව සතු ඉඩම්වලින් ඉඩම් 64 ක් සඳහා පිඹුරුපත්ද ඉඩම් 80 සඳහා ඔප්පුද නොතිබීමෙන් ඉඩම් පිළිබඳ නිරවුල් අයිතියක් තහවුරු නොවුණි. | 2020හා 2021 භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ තුලින් මේ වන විට ස්ථාවර වත්කම් ලේඛනගත වී ඇති සියලුම දේපල සඳහා පිඹුරුපත් හා ප්‍රකාශණ ඔප්පු සැකසීමට යොමු කර අවසන්ය. | ඉඩම්වල අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | **සිරිල් මැතිව් ක්‍රීඩාංගණයෙන් කොටසක් පාපන්දු සම්මේලනයට බදු දීම** | | |
| | 2006 මාර්තු 07 දින ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයට වාර්ෂිකව රු.1,000 ක නාමික බදු කුලියක් මත බදු ගිවිසුමක් රහිතව පැවරීම් සහතිකයක් මගින් වසර 33 ක් සඳහා බදු දී තිබුණි. මේ සඳහා 2018 වර්ෂයේ සිට වාර්ෂික බදු කුලිය ගෙවා නොතිබුණු අතර ඉඩමේ තක්සේරු වටිනාකම රු.19,000,000 ක් හා තක්සේරු වියදම වන රු.89,750 ක් පාපන්දු සම්මේලනයෙන් අයකරගෙන නොතිබුණි. | මේ සම්බන්ධව අවශ්‍ය නීතිමය උපදෙස් ලබා ගෙන ඒ අනුව ඉදිරි කටයුතු කිරීමට නියමිතය. | බදු ගිවිසුමක් මඟින් ප්‍රදානය කිරීමට, හිඟ කුලී අයකර ගැනීමට හා ඉඩම තක්සේරු වියදම පාපන්දු සම්මේලනයෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 3.4 මෙහෙයුම් සමාලෝචනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 24(1)(ආ) වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශයට අයත් මංමාවත් සම්බන්ධව සමීක්ෂණය කර සභා අයිතියට පවරාගෙන ගිණුම්ගත කිරීමට සහ ලේඛණගත කිරීමට කටයුතු කර නොතිබුණි. | හඳුනාගත් මාර්ග 09 ක් මිනුම් ගත කිරීම සඳහා මානක තැන වෙත භාරදී ඇති අතර, එම සැලසුම් ලබාගෙන අයිතිය පවරා ගැනීමට කටයුතු කරමි. | පනත අනුව කටයුතු කළයුතුය. |

## 3.5. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන වන විට සේවක ණය උපලේඛනය අනුව ස්ථාන මාරුවී ගිය, මියගිය, සේවය අතහැර ගිය, විශ්‍රාම ගිය සහ සේවය අවසන් කළ නිලධාරීන් 16 දෙනෙකුගෙන් අයවීම් හිඟ හිටි ශේෂය රු.880,312 ක් විය. | ණය අයකරගැනීමට කටයුතු කරමින් පවතී. | සේවක ණය අයකර ගැනීමට කටුයුතු කළ යුතුය |